# කෘෂි සංචාරේ

## නුවරඑළියට ගිය ගමන

ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ පිහිටි කුඩා දිවයිනක් වුවද එය ස්වභාවික සෞන්දර්යයෙන් අනූනය. තැනින් තැනට ක්ෂණිකව වෙනස්වන දේශගුණික තත්වයන් එහි සුන්දරත්වය වඩ වඩාත් ඔපවත් කිරීමට හේතු වී තිබෙනවා.

විවිධ ප්‍රදේශ වල ජීවත් වන ජනතාවගේ සිතුම් පැතුම් චාරිත්‍ර වාරිත්‍ර සංස්කෘතික ලක්ෂණ හා කෘෂිකාර්මික කටයුතු මෙන්ම එම ප්‍රදේශ වල ගහ කොළ සහ සතුන් අතරද සැලකිය යුතු වෙනස්කම් පවතිනවා.

එවන් වූ ප්‍රදේශවල කෘෂිකාර්මික මෙන්ම වෙනත් වැදගත් තොරතුරු සොයා බලන්න කෘෂි සංචාරයට ඔබත් එක්වන්න.

අද සචාරය පුංචි එංගලන්තය යනුවෙන් හඳුන්වන සුන්දර නුවරඑළිය ප්‍රදේශයටයි. නුවරඑළියට යන ප්‍රධාන මාර්ග කීපයක් ඇතත් අපි තෝරාගත්තේ මහනුවර සිට ගම්පොළ පුස්සැල්ලාව හරහා මාර්ගයයි. මහවැලි නදිය පසුකරමින් කොත්මලේ මිටියාවතේ සොඳුරු දසුන් මැදින් හා රම්බොඩ වෙදමුල්ල ලබුකැලේ තේ වතු පසු කරමින් පෙබරවාරියේ වැසිබර අඟහරුවාදා දිනක අපි නුවරඑළියට පැමිණියා. නුවරඑළිය නගරය මුහුදු මට්ටමේ සිට අඩි 6250 පමණ උසකිනුයි පිහිටා ඇත්තේ. නුවරඑළිය නගරයේ සිසිල් පවන් රැල් අපගේ ගතට එක් කලේ නැවුම් බවක්. මහනුවර හා සසඳන කල නුවරඑළිය අඩි 4500 පමණ උසකින් තිබෙන නගරයක්.

**නුවරඑළිය ආශ්‍රිත ප්‍රදේශ වල මුහුදු මට්ටමේ සිට උස වෙනස් වන ආකාරය (අඩි වලින්)**

| | |
|---|---|
| කඳපොළ | 6404 |
| සීතාඑළිය | 6332 |
| හාවාඑළිය | 6370 |
| මීපිළිමාණ | 6133 |
| ශාන්තිපුරය | 6993 |
| අඹේවෙල | 6104 |
| ග්‍රෙගරි වැව | 6201 |
| නානුඔය | 5388 |
| පූඩලුඔය | 3286 |
| තලවාකැලේ | 4197 |



නුවරඑළිය ප්‍රදේශය සීතල දේශගුණයකින් යුක්ත වන අතර අවුරුද්දේ මාස වල උපරිම හා අවම උෂ්ණත්වයන්හි සාමාන්‍ය අගය වෙනස් වන්නේ මේ ආකාරයටය.

| මාසය | ජන. | පෙබ. | මා. | අප්‍රේ. | මැ. | ජූනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නො. | දෙ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සාමාන්‍ය උපරිම උෂ්ණත්වය සෙ.අ. | 20 | 21.2 | 22.5 | 22.8 | 21.3 | 18.9 | 18.5 | 18.7 | 19.2 | 19.8 | 19.8 | 19.4 |
| සාමාන්‍ය අවම උෂ්ණත්වය සෙ.අ. | 9.4 | 9.4 | 10.2 | 11.4 | 12.8 | 13.2 | 12.8 | 12.7 | 12.3 | 11.9 | 11.5 | 11 |

නුවරඑළිය නගරය පසු කල අපි මීළඟට පිවිසුනේ නුවරඑළිය නගරය ආශ්‍රිත වික්ටෝරියා උද්‍යානයටයි. එංගලන්තයේ වික්ටොරියා බිසව සිහිවීම පිණිස එම උද්‍යානයට ඒ නම තබා තිබෙනවා. නුවරඑළිය ප්‍රදේශයේ වැවෙන විචිත්‍රවත් මල් වර්ග රාශියක් අපට එහිදී දැකගන්නට ලැබුනා.





DEPT. OF AGRICULTURE
CENTRAL
29 APR 2013
LIBRARY

vic


වික්ටෝරියා උයනේ දහසක් මල් අතර හද රැඳි මල් . . .



වික්ටෝරියා උද්‍යානය පසු කරමින් බදුල්ල පාරේ කිලෝමීටරයක් පමණ ගිය විට හමුවන ග්‍රෙගරි වැව නුවරඑළිය සුන්දරත්වය තව තවත් ඔපවත් කළා. ග්‍රෙගරි වැව පසුකරමින් ටික දුරක් ඉදිරියට යන විට හමුවන හංදියෙන් වමට ඇති පාරේ සීතාඑළිය ගොවිපළ බලා අපි පිටත් වුනා. සීතාඑළිය ලංකා ඉතිහාසයේ සුවිශේෂී ස්ථානයක් හිමිවෙනවා රාමා සීතා පුරාවෘත්තය අනුව සීතා කුමරිය අඳවා තබා ඇත්තේ සීතාඑළිය ප්‍රදේශයට නුදුරු ප්‍රදේශයකයි.



සීතාඑළිය ගොවිපළ බීජ අර්තාපල් නිශ්පාදනයට ප්‍රසිද්ධයක් උසුලන අතර අර්තාපල් පර්යේෂණ ආයතනය පිහිටුවා ඇත්තේද මෙම ගොවිපළ ආසන්නයේයි. ගොවිපලේ සිදුවෙන රාජකාරි පිළිබඳ අපට විස්තර කලේ ගොවිපල් කළමණාකරු එන්.ඩබ්. බණ්ඩාර මහතා විසිනි. බීජ අර්තාපල් වගා ක්ෂේත්‍රයන් වල බිම් සැකසීම සිදුකරන ආකාරය එහිදී අපට දැකගත හැකිවුනා.

**නුවරඑළිය ප්‍රදේශයේ බහුලව දක්නට ඇත්තේ මෙවැනි රතු කහ පොඩ්සොලික් වර්ගයේ පස්ය.**

සීතාඑළිය ගොවිපලේ එක් අන්තයක් ඉදිරියේදී කෘෂි පාරිසරික උද්‍යානයක් ලෙස හඳුන්වා දීමට රජය සැලසුම් කර තිබෙනවා. එය එළඹෙන නුවරඑළිය සුන්දර වසන්තයේදී දෙස් විදෙස් සංචාරකයන් සඳහා විවෘත කෙරෙනවා. ජෛව විවධත්වය අතින් ඉතා පොහොසත් මෙම බිම් කඩෙහි සැරිසරන ඔබට එහි අලංකාරය රිසිසේ විඳගැනීමට පුළුවන්. මෙහි සුන්දරත්වය විඳගැනීමට සීතාඑළිය හැරවුම් ස්ථානයේ සිට සෆාරි ජීප් රථ වල සේවය ද ඔබ වෙත ගෙන ඒමට පියවර ගෙන තිබෙනවා එසේම පාරිසරික වටිනාකම හා කෘෂිකාර්මීය වටිනාකම පිළිබඳ තොරතුරු දැනගැනීමට මග පෙන්වන්නකුගේ සහය ඉදිරියේදී ඔබ වෙත ලැබෙනවා ඇත.



සීතාඑළිය ගොවිපළ අවට සුන්දරත්වය විඳගත් අපි ඊළඟට හාවාඑළිය ප්‍රදේශය බලා පිටත් වුනා. එළවළු වගාව, අර්තාපල් වගාව හා ස්ට්‍රෝබෙරි වගාව මේ ප්‍රදේශයේ ජයටම කරන බව අපට වැටහාගැනීමට වැඩි වේලාවක් ගතවුනේ නැත. අර්තාපල් වගා භූමි වල සේවය කරන ගොවිමහතුන් ප්‍රදේශයට එක් කලේ අමුතු සුන්දරත්වයක්. ඒ වගේම එළවළු වගා වල අස්වනු නෙලන ලඳුන් ඊටත් වඩා සුන්දරත්වයක් එක් කලේ ඔවුන් ද නොදැනය.



මෙම ප්‍රදේශයේ සුන්දරත්වය විඳීමට ඔබ පැමිණියෙ නම් ස්ට්‍රෝබෙරි ගෙඩියක රස බලා මඟ දෙපස ඇති ගොවිපල් වලින් නෙලාගන්නා ලද නැවුම් එළවළු ටිකක් මිලදී ගැනීමේ සිතුවිල්ලක් පහල වන බවට නොඅනුමානය. . .





සරුසාරව වැඩී ඇති අර්තාපල් වගාවක්







මේ සියලු කටයුතු වලට නුවරඑළියේ පවතින දේශගුණික තත්ත්ව ප්‍රධානව බලපානු ලබයි. ඉන් වර්ෂාපතනයද ප්‍රධාන තැනක් හිමිවේ.

ජනවාරි සිට අප්‍රේල් දක්වා අඩු වර්ෂාපතනයක් ද මැයි සිට අගෝස්තු දක්වා සාමාන්‍ය වර්ෂාපතනයක් ද සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා වැඩි වර්ෂාපතනයක් ද වැනි වූ වර්ෂාපතන රටාවක් නුවරඑළිය ප්‍රදේශයට ආවේණික වී ඇත.

**ඒ අනුව ඔබේ කැමැත්ත පරිදි සංචාරය සැලසුම් කර ගන්න.**

මෙවන් වූ සුන්දරත්වයක් විඳගත් අපි අදට ගොවිකම් සඟරාවේ කෘෂි සංචාරයේ පිටුවෙන් සමුගන්නවා. එසේ වුවද අපේ සංචාරය නුවරඑළිය ප්‍රදේශය අවට සිදු කරනවා. එහි රසබර තොරතුරු ලබන කලාපයෙන් ඔබ වෙත ගෙන ඒමට ද බලාපොරොත්තු වෙනවා. . .

ගොවිකම් සඟරාවේ අපි